# ප්‍රසම්පාදන දැන්වීම

## දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

## දකුණු පළාත් සභාව

ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් වැඩ යෝජනා සඳහා 2023.06.01 දින සිට 2023.06.21 දින ප.ව.2.30 දක්වා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන්,දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ලංසු පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | ව්‍යාපෘති අංකය | පාසල | වැඩ විස්තරය | අවශ්‍ය CIDA ලියාපදිංචිය | ආපසු නොගෙවනු ලබන ඇප තැන්පත් (රු.) | ලංසු ඇපකර වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|
| 01 | G/C/23/01 | ගා/කොබෙයිදූව ක.වි | 90'*25' තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම -(ඉතිරි වැඩ) | C6,C7 and C8 | 3,500.00 | 71,000.00 |
| 02 | G/C/23/02 | ගා/අමුගොඩ සුධාරක ප්‍රා.වි | 90'*25' දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම -(ඉතිරි වැඩ) | C7,C8 and C9 | 2,500.00 | 35,000.00 |
| 03 | G/C/23/03 | ගා/ගිංතොට ම.වි | 90'*25' තෙමහල් ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම | C8, and C9 | 1,500.00 | 14,000.00 |
| 04 | G/C/23/12 | ගා/ශ්‍රී කල්‍යාණතිස්ස ක.වි. | 140*40 ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියා කිරීම | C7,C8 and C9 | 2,500.00 | 38,500.00 |
| 05 | G/C/23/13 | ගා/මිරිස්වත්ත ම.වි | ප්‍රධාන ශාලාව නවීකරණය කිරීම | C7,C8 and C9 | 2,000.00 | 25,000.00 |
| 06 | H/C/23/01 | හ/විහාරගල ප්‍රා.වි | 90'*25' දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම -(ඉතිරි වැඩ) | C6,C7 and C8 | 3,500.00 | 71,000.00 |
| 07 | H/C/23/02 | හ/මීගහජඳුර ම.වි | ගොඩනැගිලි හා වැසිකිළි නවීකරණය | C7,C8 and C9 | 2,500.00 | 38,000.00 |
| 08 | H/C/23/03 | හ/තංගල්ල ආදර්ශ ප්‍රා.වි | දෙමහල් ගොඩනැගිල්ල නවීකරණය | C6,C7 and C8 | 3,000.00 | 51,000.00 |
| 09 | H/C/23/04 | හ/කුඩාහිල්ල ම.වි | 80*20 ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියා කිරීම. | C7,C8 and C9 | 2,000.00 | 27,500.00 |
| 10 | H/C/23/05 | හ/අබේසේකරගම ම.වි. | 40*20 ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියා කිරීම | C7,C8 and C9 | 2,000.00 | 22,000.00 |
| 11 | H/C/23/06 | හ/රන්න වාඩියගොඩ ක.වි. | 80*20 ගොඩනැගිල්ල අලුත්වැඩියාව | C7,C8, and C9 | 2,000.00 | 18,000.00 |
| 12 | H/C/23/07 | හ/රන්මුදුවැව ක.වි. | 100*20 ගොඩනැගිල්ල නවීකරණය | C7,C8, and C9 | 2,000.00 | 26,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | H/C/23/08 | හ/බටඅත දකුණ ක.වි. | දෙමහල් ගොඩනැගිල්ලේ අත්‍යාවශ්‍ය නවීකරණය | C7,C8, and C9 | 2,000.00 | 24,000.00 |
| 14 | H/C/23/09 | හ/කුඩාබෝලාන පඤ්ඤාසීහ ම.වි. | 60*20 ගොඩනැගිල්ල අලුත්වැඩියාව (ඉතිරි වැඩ) | C8, and C9 | 1,500.00 | 14,000.00 |

02. ජාතික තරඟකාරී ලංසු පටිපාටිය මත ලංසු ඉදිරිපත් කල යුතුය.කොන්ත්‍රාත් ප්‍රධානයේදී සුදුසුකම් ලබන සාර්ථක ලංසුකරුවන් අසාධු ලේඛනගත නොවිය යුතු අතර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ඉහත කාණ්ඩ යටතේ ලියාපදිංචි වී සිටිය යුතුය.

03.රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 හා 2020.10.09 දිනැති,03/2020(1) හා 2021.01.11 දිනැති සහ රුපියල් මිලියන 50ට අඩු ව්‍යාපෘති සඳහා වන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2016 (iv) හා 2023.02.09 දිනැති චක්‍රලේඛ වල සඳහන් කොන්දේසි වලංගු වන අතර පළාත් ප්‍රමුඛතාවය සහ ලංසු ලේඛනයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් පිළිබඳව ලංසු ඇගයීමේදී සැලකිල්ලට ගනු ලැබේ.

04.ලංසු අයදුම්පත් 2023.06.01 දින සිට 2023.06.20 දින දක්වා පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ලබුදූව,දක්ෂිණ පාය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් (බිම් මහල) ලබා ගත හැකිය. වැඩි විස්තර සඳහා අමාත්‍යාංශයේ මෙම අංශයට වැඩ කරන දින ඇමතීමෙන් ලබා ගත හැකිය. 091-2030700

05. මුද්‍රා තබන ලද ලංසු පත්‍රිකා 2023.06.21 ප.ව 2.00 ට පෙර ලැබෙන සේ ලේකම්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් රැගෙන විත් ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ලංසු විවෘත කිරීම 2023.06.21 දින ප.ව.2.30 ට දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපතිගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශයේදී සිදු කරන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලයලත් නියෝජිතයන් හට සහභාගී විය හැක.

07. ලංසුව සමඟ ඉදිරිපත් කරන ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා වානිජ බැංකුවකින් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නමට ලබා ගත් 2023.06.21 දින සිට 2023.10.06 දක්වා වලංගු ලංසු ඇපකරයක් හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබාදෙන මුදල් කුවිතාන්සියේ පිටපතක් ලංසු පත්‍රිකාව සමඟ ඉදිරිපත් කළ යුතුය. චෙක්පත් හෝ බැංකු ඇපකර ලෙස ඉදිරිපත් කරනු ලබන ලංසු ඇපකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. ලංසු වලංගු කාලය දින 77 කි.

09. ඉදිරිපත් කරනු ලබන වැඩයට අදාල ලංසු පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළයුතු අතර ඉදිරිපත් කරන මිල ගණන් ආවරණය වන පරිදි සෙලෝටේප් අලවා තිබිය යුතුය. එහි මුල් පිටපතෙහි " මුල් පිටපත" යනුවෙන් සඳහන් කළ යුතු අතර අනු පිටපතෙහි " අනුපිටපත" යනුවෙන් සඳහන් කළ යුතුය. ලංසුපත් වල මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා එම කවරය මුද්‍රා තබා කවරයේ වම් පස උඩකෙළවරේ කර්මාන්තයේ නම සහ අංකය සඳහන් කළ යුතුය.

10.ලංසුපත් ඉදිරිපත් කිරීමට පෙර අදාල වැඩබිම් පරීක්ෂා කර තිබීම වැදගත් වන බැවින් වැඩබිම පරීක්ෂා කොට ලංසුපත් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

11.අඩුපාඩු සහිත ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලබාගෙන ලංසු ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ ලංසු ඇප මුදල් රාජසන්තක කරනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය බව සැලකිය යුතුය.

රංජිත් යාපා,

ප්‍රසම්පාදන කමිටු සභාපති,

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,

පළමු මහල, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල.

2023.06.01